# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1756/9 - 2012 මැයි 03 වැනි බ්‍රහස්පතින්දා - 2012.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක : 19

### 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

### 20(5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, වෙළෙන්දෙකු, ආනයනකරුවකු හෝ බෙදාහරින්නෙකු විසින් කිසිඳු සම්පූර්ණ යොදය සහිත කිරිපිටි වර්ගයක් පහත දක්වා ඇති උපරිම සිල්ලර මිලට වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| | *උපරිම සිල්ලර මිල*<br>*රු. ශ.* |
|---|---|
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුව | 319.00 |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 පැකට්ටුව | 785.00 |

ඉහත දක්වා ඇති ප්‍රමාණයේ සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ඇසුරුම් හැරුණු විට ග්‍රෑම් 400ට වඩා අඩු ඇසුරුම් සඳහා ග්‍රෑම් 100ක් සඳහා රු. 80.00ක අනුපාතික මිළකට වැඩියෙන් විකිණීම නොකළ යුතු අතර, ග්‍රෑම් 400ට වඩා වැඩි ඇසුරුම් සඳහා ග්‍රෑම් 100ක් සඳහා රු. 78.50ක අනුපාතික මිලකට වැඩියෙන් විකිණීම නොකළ යුතු ය.

සම්පූර්ණ යොදය සහිත කිරිපිටිවල උපරිම සිල්ලර මිල සම්බන්ධයෙන් 2011 මැයි මස 02 වැනි දින අංක 1704/8 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග අංක 16 මෙමගින් පරිච්ඡින්න කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2012 මැයි මස 03 වැනි දින,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
කොළඹ දී ය.


1A - G 15849— 485 (2012/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.